**ශීර්ෂය 298 - මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

1.1 **තත්ත්වාගණනය කළ මතය**

---

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 අප්‍රේල් 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අප්‍රේල් 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) මෙම වාර්තාවේ 2.1 ඡේදයේ නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ දී මා විසින් කළ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු ශේෂ පිරික්සුමේ හර සහ බැර ශේෂයන් අතර රු.2,093,408 ක වෙනසක් නිරීක්ෂණය විය. 2020 ජූලි සහ අගෝස්තු මාස වල වැටුප් ගෙවීම සඳහා ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම හේතුවෙන් මිනුම් ඒකක ප්‍රමිත හා සේවා අරමුදලින් ලබා ගත් රු.2,093,408 ශේෂ පිරික්සුමට ඇතුළත් නොවීම මෙම වෙනසට හේතු වී තිබුණි. | 2020 ජූලි හා අගෝස්තු මාසවල දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගරයෙන් ප්‍රමාණවත් අක්මුදල් නොලැබුණු නිසා අරමුදලින් රු. 2,093,408ක මුදලක් ලබාගන්නා ලදී.එය සිගාස් (CIGAS) පරිගණක වැඩසටහනට ඇතුලත් කිරීමේදි ප්‍රධාන කාර්යාලයෙන් ලද අග්‍රිම (imprest from head office) ලෙස සටහන් කරන ලදි.එම නිසා ශේෂ පිරික්ෂුමේ හර සහ බැර අතර වෙනස ඇති වී තිබෙන බව දන්වා සිටිමි. | ශේෂ පිරික්සුමේ හර සහ බැර ශේෂ එකතුව සමාන විය යුතු වේ. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස හඳුනා ගත යුතු වටිනාකම දෙපාර්තමේන්තුවේ විස්තරාත්මක ශේෂ පිරික්සුමට අනුව රු.7,831,253.35ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.2,809,510 ක් ලෙස දක්වා තිබුණෙන් රු.5,021,743.35 ක වෙනසක් විය. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස දක්වා ඇති රු.2,809,510 අග්‍රිම ගිණුම හා සම්බන්ධ වෙනත් ලැබීම් වේ.ශේෂ පිරික්ෂුමට අනුව වන රු.7,831,253 වෙනත් ලැබීම් මාසික ගිණුම් සාරාංශ මගින් භාණ්ඩාගාරයට වාර්තා කිරීම පමණක් සිදු කරයි. | විස්තරාත්මක ශේෂ පිරික්සුමෙහි දැක්වෙන අගය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස හඳුනා ගත යුතුය. |

## 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ මාසික ගිණුම් සාරාංශ අනුව අත්තිකාරම් අයකර ගැනීම් වටිනාකම රු.6,241,204 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම ඇතුලත් කර නොතිබුණි. | අත්තිකාරම් අයකරගැනීම් මුදලින් හා හරස් සටහන් වලින් සිදුවේ. ඒ අනුව මුදලින් අයකර ගැනීම් රු.519,563 ක මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ දක්වා ඇත. හරස් සටහන් මගින් අය කරගැනීම් මුදලින් සිදු නොවන නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර නොමැති බව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධාන අනුව ගිණුම් තැබීම සිදුකළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 සැලැසුම් කිරිම

-----------------

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්මේ යාවත්කාලින කල ආයතනයේ සංවිධාන ව්‍යුහය ඇතුලත් කර නොතිබුණි. | අප අයත් වන අමාත්‍යාංශය විසින් අපවෙත ලබාදෙන ආකෘතිය අනුව ක්‍රියාකාරි සැලැස්ම සෑම වර්ෂයක් ආරම්භයේදීම අමාත්‍යාංශය වෙත යොමු කෙරේ. මින් ඉදිරියට ක්‍රියාකාරි සැලැස්ම සමග යාවත්කාලීන කරනු ලබන ආයතනයේ සංවිධාන ව්‍යුහයද යැවීමට කටයුතු කරමි | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්මේ යාවත්කාලින කල ආයතනයේ සංවිධාන ව්‍යුහය ඇතුලත් කළ යුතු වේ. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

----------------------------------

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 ( 2 ) උප වගන්තියට අනුව සෑම ආස්ථිත්‍යයක් විසින්ම එහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාව කඩිනමින් ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 ( 2 ) උප වගන්තියට අනුව සෑම ආස්ථිත්‍යයක් විසින්ම එහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් යුතුය. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද දත්ත රැස් කිරිම සඳහා වන සැළසුමක් හෝ වැඩ සටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඇත්තේ දෙපාර්තමේන්තුවේ වැඩසටහන් හා ක්‍රියාකාරකම්වලට අදාලවය. ඒ අනුව තිරසාර සංවර්ධන අරමුණු වෙනුවෙන් වෙනම දත්ත රැස්කිරීමක් සිදු නොවන අතර අදාල වැඩසටහන් හා ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අනුව තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම පිළිබඳ ප්‍රගතිය වාර්තා කිරීමට නියමිතය. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ඉටු කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

**5.** **යහපාලනයෙ**

**5.1** **විගණන හා කළමනාකරණ කමිටුව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 ජනවාරි 28 දිනැති අංක ඩීඑම්ඒ / CIR-EDIT / 2016 චක්‍රෙල්ඛයේ 2 වන ඡේදය අනුව කාර්තුවකට අවම වශයෙන් එක් රැස්වීම බැගින් වාර්ෂිකව රැස්වීම් 04 ක් පැවාත්විය යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි. | රටේ පැවති කොරෝනා වසංගතය හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්විම් පැවැත්වීමට නොහැකි වූ බව දන්වා සිටිමි.2021 වර්ෂයේ පළමු විගණන හා කළමනාකරණ කමිටු රැස්විම 2021 මාර්තු 18 දින පවත්වන ලදි. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වේ. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ----------------------------------- | ------------ |
| (අ) දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කල කාර්යමණ්ඩල තොරතුරු අනුව 2020 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්යමණ්ඩලය 19 ක් වූ අතර ඉන් සහකාර අධ්‍යක්ෂ තනතුරු 09 ක් එනම් සියයට 47 ක් පුරප්පාඩුව පැවතුණි. | මෙම බඳවා ගැනීම් සඳහා තොරතුරු විද්‍යාත්මක සේවා අංශය වෙත යවා ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන ආයතනයේ පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කල යුතු වේ. |
| (ආ) අනුමත තෘතීයක මට්ටමේ තනතුරු 30 ක් අතුරින් 26 ක් එනම් සියයට 86 ක් පුරප්පාඩුව පැවතුණි. | රසායනාගාර සහකාර, මිනුම් සේවා සහයක හා කාර්මික ශිල්පී බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | -එම- |